# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.06.15

වර්ෂ 2022 ක් වූ ජුනි මස 15 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජුනි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
09. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
11. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
12. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
13. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
14. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-</u>**

**<u>01. 2022-05-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-05-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-05-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන ඃ-** 01. 2022-05-09 වන දින රට තුළ ඇති කළහකාරි සිදුවීමේදී නිවාස හා දේපළ හානිවීම් වලට ලක්වූ ගරු වැව්ලි අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා හට, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා හට, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා හට සහ මෙම දිනය තුළ නිවාස, දේපළ සහ ජීවිත හානි සිදුවූ අනෙකුත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතනවල ගරු මහජන නියෝජිතයින්, හිටපු ගරු පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළු අනෙකුත් සියළුම දෙනා හට සිය සංවේගය ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඇතුළු සියළුම ගරු සභිකවරු විසින් පළ කර සිටීම.

**සංශෝධන ඃ-** 02. 2022-05-09 වන දින ගරු සභාපති දිල්රුක් අබේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා සහ ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා කොළඹ පිහිටි අරලියගහ මන්දිරයට යන ලද්දේ හිටපු ගරු අග්‍රමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය ධූරයට සමුදීම නිමිතිකොට ගෙන පැවැත්වූ සමුගැනීමේ උත්සවය සඳහා බව.

**සංශෝධන ඃ-** 03. 2022-05-09 දින රට තුළ පැවති කළහකාරි සිදුවීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණට චෝදනා එල්ල කළද ඒ සඳහා එම පක්ෂයේ සම්බන්ධයක් නොමැති බව සහ එම පක්ෂයේ කිසිදු සාමාජිකයෙකු ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන නොමැති බව.

**සංශෝධන ඃ-** 04. 2022-05-09 දින හා ඒ ආශ්‍රිත දිනවල ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාගේ නිවාස සහ දේපළ වලට හානි කිරීමට ප්‍රචණ්ඩකාරීන් උත්සාහ දරා ඇති නමුත් නිවාස සොයා ගැනීමට අපහසුවීම නිසා එම තත්ත්වය මගහැරී ඇති බව.

2022-05-18 දින පැවති මහා සභා රැස්වීමේදී උක්ත කරුණ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළද න්‍යාය පත්‍රයට අදාළ නොවන කරුණු නිසා මහා සභා රැස්වීම් වාර්තාවට ඇතුළත් නොවීම හේතුවෙන් ගරු සභාපති දිල්රුක් අබේකෝන් මැතිතුමා, ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සහ අනෙකුත් ගරු මන්ත්‍රීවරුන්ගේ සහ ගරු මන්ත්‍රීවරියන්ගේ ඉල්ලීම පරිදි විශේෂ අවස්ථාවක් සේ සලකා ඉහත සංශෝධන මහා සභා රැස්වීමට ඇතුළත් කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

(පෙ.ව. 09.50ට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

2022-05-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ-**

සිට්ට්‍රස් වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු දිගටම සිදුකරගෙන යන බවත්, ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල වැඩිවීම සම්බන්ධව අදාළ ආයතනය විසින් මේ වනතෙක් ඉල්ලීම් කොට නොමැති බවත්, ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල වැඩිවීම නිසා කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට නතර වී ඇති බවත්, මේ වන විට සිදුකර ඇති වැඩ කොටස් සඳහා ගෙවීම් කිරීමෙන් අනතුරුව ඉතිරි වැඩ සඳහා නව ඇස්තමේන්තුවක් සකස්කොට නැවත ටෙන්ඩර් කොට සිදුකරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති බවත්, නව මිල යටතේ සකස්කරන ලද ඇස්තමේන්තුවකට අනුව ඉතිරි වැඩ කොටස් සිදුකිරීම මෙම කොන්ත්‍රාත්කරු හරහාම සිදුකර ගැනීමට බලාපොරොත්තු වන බවත්, ඒ සඳහා ගරු වැවිලි අමාත්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමා සහ ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාවක් ලබාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බවටත්, රට තුළ පවතින ගැටලුකාරි තත්ත්වය මත සේවකයන් රාජකාරි සඳහා කැඳවීම සීමා කොට ඇති බැවින් ඒ සඳහා නිකුත්කොට ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව අවශ්‍ය කටයුතු සිදුකරන බවටත්, බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ ජනතාව වගා කටයුතු සඳහා පෙළඹවිය යුතු බවත්, වගා කටයුතු සඳහා අවශ්‍ය කාබනික පොහොර සභාව හරහා මිලදී ගත හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** සභා පරිශ්‍රයේ ඇති කලේගාන පොළ භූමියෙන් ඉවත් කරන ලද උළු සහ දැව කොටස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් සභා අරමුදලට බැර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගියවර පැවති වෙන්දේසියේදී සභාව වෙත අපවාද එල්ල වූ බැවින් මෙවර එම අඩුපාඩු සිදුනොවීමට වග බලාගන්නා ලෙස ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සභා පරිශ්‍රයේ ඇති කලේගාන පොළ භූමියෙන් ඉවත් කරන ලද උළු සහ දැව කොටස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් සභා අරමුදලට බැර කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** අප ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුම්ගත වී ඇති කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සහ සිට්ටුස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2022-05-24 දිනැති CSS/7/1/1-6 අංක දරණ චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කලේගාන පොළ පැවති භූමියේ ඉදිකරනු ලබන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු වල දැනට පවතින තත්ත්වය අනුව කොළම් කණු පොළව මට්ටමට කොන්ක්‍රීට් කොට අඩි 10ක් පමණ උසට කම්බි යොදා ඇති නමුත් බේස් වලවල් සඳහා පස් හෝ ABC යොදා පුරවා නොමැති බවත්, එබැවින් අනතුරුදායක තත්ත්වයක් ඇති අතර වැසි කාලයේදී ඩෙංගු මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවයක් ඇති බවත්, සියළුම කම්බි මේ වන විට මල බැඳෙමින් පවතින බවත්, තවත් ටයිබීම් කිහිපයක් ඉදිකිරීමට ඇති බවත්, මෙම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නතර කරන්නට සිදුවීම කණගාටුදායක තත්ත්වයක් බවත්, මේ වන විට මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ එකසිය විස්සක පමණ මුදලක් වැයවී ඇති බවත්, මෙම තත්ත්වයෙන් කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමුවහොත් මෙතෙක් වැය කරන ලද රුපියල් ලක්ෂ එකසිය හතලිහක මුදල අපතේ යන බවත්, මෙම ස්ථානයේ නැවත වෙන ගොඩනැගිල්ලක් ඉදිකරන්නේ නම් මෙම ඉදිකිරීම් කොටස් ඉවත් කිරීමට සිදුවන බවත් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කොන්ක්‍රීට් කණුවල සහ ටයිබීම්වල වැඩ කටයුතු අවසන් කරන ලෙස අදාළ කොන්ත්‍රාත් ආයතනය වෙත දැනුම් දී ඇති බවත්, ඒ සඳහා එම කොන්ත්‍රාත් සමාගම එකඟවී ඇති බවත්, ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා සමග සාකච්ඡාකොට මේ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(පෙ.ව. 10.05ට ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නව මිල ගණන් අනුව සකස්කරන ලද ඇස්තමේන්තුවක් අනුව නැවත ටෙන්ඩර්කොට සිදුකරනවාද නැතහොත් නව මිල අනුව සකස්කරන ලද ඇස්තමේන්තුවක් අනුව මෙම කොන්ත්‍රාත් ආයතනය මගින් සිදුකරනවාද යන තීරණය ඉක්මනින් ලබාගත යුතු බවත්, නැවත ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩරය වෙනත් ආයතනයක් වෙත පිරිනැමීමට සිදුවුවහොත් දැනට ගිවිසුම්ගත වී ඇති කොන්ත්‍රාත් ආයතනය වෙත ගිවිසුම්ගත වූ මුදල අනුව සහ ව්‍යාපෘතියේ ස්වභාවය අනුව යටිතල පහසුකම් සහ යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීමට සහ යම් යම් දේවල් අලුතෙන් මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීමට සිදුවන බවත්, එය විශාල මුදලක් විය හැකි බවත්, මෙහි ඇති සම්පූර්ණ කොළම් කණු ගණන 93ක් බවත්, ඒවායේ 20x16 ප්‍රමාණයේ යකඩ කම්බි හය බැගින් අන්තර්ගත බවත්, මල බැඳීමකට ලක්වුවහොත් එම කම්බි කොන්ක්‍රීට් යෙදීමට යොදා ගැනීමට අනුමත නොකරන බවත්, නැවත ටෙන්ඩර්කොට මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට යාමෙන් විශාල පාඩුවක් සිදුවන බවත්, එබැවින් නව මිල ගණන් අනුව සකස්කරන ලද ඇස්තමේන්තුවක් අනුව මෙහි ඉදිකිරීම් කටයුතු දැනට ගිවිසුම්ගත වී ඇති ආයතනය වෙත ලබාදීම සුදුසු බවත් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කලේගාන වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් සම්බන්ධව ඇති ගැටළු සම්බන්ධව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙත දැනුම් දී ඇති බවත්, ඒ අනුව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා සහ අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් ලබාගෙන මේ සඳහා තීන්දුවක් ලබා ගැනීමට බලාපොරොත්තු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුම්ගත වී ඇති කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සහ සිට්ටුස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2022-05-24 දිනැති CSS/7/1/1-6 අංක දරණ චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.** අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන හිරිඹුරගම සුමුදු පෙර පාසලේ සහ කලේගාන අරුණළු පෙර පාසලේ පෙර පාසල් ගුරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද දේවමුණිගේ ඉමේෂිකා මධුෂානී මිය සහ යද්දෙහිවත්තගේ රුවනි මධුවන්ති මිය හට සභා අරමුදලෙන් රා.ප.ච 03/2016 PL – 2016A අනුව දෛනික වැටුප, ඒ සඳහා හිමි අනෙකුත් දීමනාද සමඟ ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩබ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ වන තෙක් මෙම පෙර පාසල් ගුරුවරුන් දෙපළ ස්වෙච්ඡාවෙන් සේවයේ නිරත වන බවත්, හිරිඹුරගම සුමුදු පෙර පාසලේ පෙර පාසල් ගුරුතුමිය වන දේවමුණිගේ ඉමේෂිකා මධුෂානී මිය හට වැටුප් ගෙවීමට අනුමත වී ඇති බවත්, කලේගාන අරුණළු පෙර පාසලේ පෙර පාසල් ගුරුතුමිය වන යද්දෙහිවත්තගේ රුවනි මධුවන්ති මිය හටද වැටුප් ගෙවීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, එම පෙර පාසල් ගුරුතුමියගේ එක් සහතිකයක අඩුපාඩුවක් ඇති බවත්, එය ලබාදුන් පසු අදාළ අනුමැතිය ලබාගෙන වැටුප් ගෙවීමට කටයුතු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන හිරිඹුරගම සුමුදු පෙර පාසලේ සහ කලේගාන අරුණළු පෙර පාසලේ පෙර පාසල් ගුරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද දේවමුණිගේ ඉමේෂිකා මධුෂානී මිය සහ යද්දෙහිවත්තගේ රුවනි මධුවන්ති මිය හට සභා අරමුදලෙන් රා.ප.ච 03/2016 PL – 2016A අනුව දෛනික වැටුප, ඒ සඳහා හිමි අනෙකුත් දීමනාද සමග ගෙවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ බාහිර විදුලි ආලෝකකරණ පද්ධතිය, වැසිකිළි පද්ධතිය හා ජලනල පද්ධතිය අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ලබුදූව වෙළඳ සංකීර්ණයේ බාහිර විදුලි ආලෝකකරණ පද්ධතිය, වැසිකිළි පද්ධතිය හා ජලනල පද්ධතිය අළුත්වැඩියා කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05.** හපුගල, මොල්ලිගොඩවත්ත, ආසිරි අයර්න් වර්ක්ස් ආයතනය අසළින් ඇති මාර්ගය වර්ෂා කාලයේදී ජලයෙන් යටවන බැවින් මාර්ගය උස්සා සපත්තු කාණුවක් සමග කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තම ප්‍රදේශවලද මාර්ග සංවර්ධනය කිරීමට ඇති බැවින් එම කටයුතු සඳහාද ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත්, පස් දමා සංවර්ධනය කළයුතු මාර්ගයන් තම කොට්ඨාශයේ ඇති බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු ඇස්තමේන්තු සකස්කළද සංවර්ධන කටයුතු තාවකාලිකව නවත්වන ලෙස චක්‍රලේඛනයක් නිකුත්කොට ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ප්‍රීමික්ස් ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන ලෙස ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

අමුද්‍රව්‍ය වල මිල ගණන් ඉහළ ගියද ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ඉදිරියේදී බලාපොරොත්තු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හපුගල, මොල්ලිගොඩවත්ත, ආසිරි අයර්න් වර්ක්ස් ආයතනය අසළින් ඇති මාර්ගය වර්ෂා කාලයේදී ජලයෙන් යටවන බැවින් මාර්ගය උස්සා සපත්තු කාණුවක් සමග කොන්ක්‍රීට් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව 10.15ට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ මෑණියන් අභාවප්‍රාප්තවීම සම්බන්ධව ගරු සභාපතිමාගේ, ගරු උප සභාපතිතුමාගේ සහ සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහ ගරු මන්ත්‍රීවරියන්ගේ සාතිශය සංවේගය ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා වෙත පළ කරන ලද අතර සිය මෑණියන්ගේ අවමංගල්‍ය උත්සවයට සහභාගිවූ සහ සහභාගිවීමට හැකියාව නොමැති වූ සහ නන් අයුරින් සහයෝගය දැක්වූ සියළුදෙනාටම සිය ස්තුතිය ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් පළ කරන ලදී.

(පෙ.ව 10.25ට ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>

**06.** ඩෙංගු උවදුර වැළැක්වීම සඳහා තොටගොඩ අත්ථදස්සී මහා විද්‍යාලය මගින් 2022-06-24 වන දින සංවිධානය කරනු ලබන ශ්‍රමදාන වැඩසටහන සඳහා අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වැසිකිළි වළවල් සහ කඩා වැටී ඇති ශාලාවල්වල ජලය රඳා පවතින බැවින් ඩෙංගු උවදුර පැතිරීමේ අවධානමක් ඇති බැවින් මේ සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ලබාදෙන ලෙසත් මේ සඳහා තොටගොඩ අත්ථදස්සී මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් ඉල්ලීම් ලිපියක් යොමුකොට ඇති බවත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ඩෙංගු උවදුර වැළැක්වීම සඳහා තොටගොඩ අත්ථදස්සී මහා විද්‍යාලය මගින් 2022-06-24 වන දින සංවිධානය කරනු ලබන ශ්‍රමදාන වැඩසටහන සඳහා අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ලබාදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.** තොටගොඩ හේනවත්ත සහ දොස්තරදූව දක්වා ඇති මාර්ගය අඩි 14ක් පළල වන සේ සුදුසු පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය සභාව මගින් ගැසට් කොට ඇති මාර්ගයක් බවත්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා අවශ්‍ය වන අනුමැතිය ලබාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකළ යුතු බවට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව තොටගොඩ හේනවත්ත සහ දොස්තරදූව දක්වා ඇති මාර්ගය අඩි 14ක් පළල වන සේ සුදුසු පරිදි සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**08.** අපේගම, සිරිල් ගාල්ලගේ මහතාගේ නිවස අසළ කාණුව සුදුසු පරිදි සකස්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අපේගම, සිරිල් ගාල්ලගේ මහතාගේ නිවස අසළ කාණුව සුදුසු පරිදි සකස්කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** නාගරුක්ඛාරාම පාර, චූලානන්ද මහතාගේ නිවස අසළ අතුරු මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නාගරුක්ඛාරාම පාර, චූලානන්ද මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සහ කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට ලෙස ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව නාගරුක්ඛාරාම පාර, චූලානන්ද මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සහ කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**10.** රජය මගින් ඉදිරිපත් කර ඇති වගා සංග්‍රාමය අනුව බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ පිහිටා ඇති වගා නොකරන භූමි හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දැනුවත් කිරීම් සිදු කොට වගා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කලේගාන ශ්වේතබිම්බාරාම විහාරස්ථානයේ භූමිය වගා කටයුතු සඳහා සභාව වෙත ලබාදීමට විහාරාධිපති හිමියන් විසින් කැමැත්තෙන් සිටින බවටත්, මීට අමතරව සභාව සතු හිස් ඉඩම්වලද වගා කළ හැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාව සතු ඉඩම්වල තාවකාලික භෝග වගා කටයුතු සිදු කිරීම සඳහා සමිති සඳහා ලබාදීම ගැටළුවක් නොමැති බවත්, ස්ථිර භෝග වගා කිරීමට අවස්ථාව ලබාදිය නොහැකි බවත්, කොට්ඨාශ ගරු මන්ත්‍රීවරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම කාර්යය සිදුකළ හැකි බවද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අපේගම, සිරිල් ගාල්ලගේ මහතාගේ නිවස අසළ කාණුව සුදුසු පරිදි සකස්කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**11.** අප ප්‍රාදේශීය සභාවට අයත් භූමිවල දිගුකාලීන හා කෙටිකාලීන භෝග වගා කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවට අයත් භූමිවල දිගුකාලීන හා කෙටිකාලීන භෝග වගා කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**12.** කලේගාන වී.සී පාරේ පිහිටි සභාව සතු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන කලේගාන උප තැපැල් කාර්යාලයෙන් මාසික බදු කුලිය අයකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කලේගාන උප තැපැල් කාර්යාලය පිහිටි සභාව සතු කඩකාමරය සඳහා මේ දක්වා කඩ කුලී අය නොකරන බවට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම කඩ කාමරය සඳහා තක්සේරුවක් සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව ලබා දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කලේගාන දැව කැටයම් මධ්‍යස්ථානය පිහිටි කඩ කාමරය සඳහා ලබා දී ඇති තක්සේරු මුදල ගෙවිය නොහැකි බවට එම සමිතිය විසින් දැනුම් දී ඇති බවට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කලේගාන වී.සී පාරේ පිහිටි සභාව සතු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන කලේගාන උප තැපැල් කාර්යාලයෙන් මාසික බදු කුලිය අයකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**13.** කලේගාන, ඉසුරු පෙදෙසේ පොදු ළිඳ පිහිටි භූමියෙන් කොටසක් ලබාගෙන ඒ අසළ මාර්ගය වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ස්ථානය හරහා විශාල ජල පහරක් ගලා බසින බවත්, මීට පෙර අවස්ථාවකදී එම ස්ථානයේ පිහිටි බැම්මක් කැඩී යාම නිසා එය ඉදිකරගැනීමද ඒ අවට ප්‍රදේශවාසීන් එකතු වී සිදු කල බවත්, ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම සංවර්ධන කටයුත්ත එම යෝජනාව ඉදිරිපත් කරන ලද පුද්ගලයන් විසින් සිදුකර ගැනීමට එකඟතාවය පලකළ බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ස්ථානය සංවර්ධනය කිරීම පිළිබඳව තාක්ෂණ නිලධාරිනියට සභාව වැඩිදුරටත් දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරිනි අයි.ඩී. කමණි චන්ද්‍රලතා මිය පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම සංවර්ධන කටයුත්ත සිදුකිරීමේදී පොදු ළිඳ අසලට කොන්ක්‍රීට් බැම්මක් යෙදිය යුතු බව
- එවිට මාර්ගයේ පළල අඩි 15ක් පමණ වනතෙක් පළල් කළ හැකි නමුත් එය වාහන දෙකක් මාරුවීම සඳහා ප්‍රමාණවත් විය නොහැකි බව

කාරක සභා අවස්ථාව අවසන් කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කලේගාන, ඉසුරු පෙදෙසේ පොදු ළිඳ පිහිටි භූමියෙන් කොටසක් ලබාගෙන ඒ අසළ මාර්ගය වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විදෙස්ගත වී ඇති බැවින් එතුමාට නිවාඩු අනුමත කරන ලෙස ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නිවාඩු අනුමත කරගැනීමකින් තොරව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විදෙස්ගත වීම පිළිබඳව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත දැනුම් දී මේ සඳහා උපදෙස් ඉල්ලා සිටි බවත්, 2022-05-30 දිනැති ලිපියක් මගින් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විදෙස්ගත වන බවට සභාව වෙත දැනුම් දී ඇති නමුත් එම ලිපිය අප ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇත්තේ 2022-06-10 වන දින බවත්, විදෙස් ගතවන රට හෝ කාලවකවානුව සම්බන්ධව එම ලිපියේ අන්තර්ගත වී නොමැති බවත්, පළාත් පාලන අයතනවල මහජන නියෝජිතයන් විදෙස්ගත වන විට විශේෂ නිවාඩු අනුමත කර ගැනීමක් සිදුකළ යුතු බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u> ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව :- නැත**

**02. තාක්ෂණික සේවා කමිටුව :-**

I. 2022-05-27 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව :- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව :- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ මැයි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**04. වෙනත් ලේඛන** ඃ-

**I.** ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සභාගත කරන ලදී.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ ජුනි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

කපුහෙම්පල කොට්ඨාශයේ කොට්ඨාශයේ නවීකරණය කළ යුතු පොදු ළිං කිහිපයක්ම ඇති බවත්, තොටගොඩ රිචඩ් පතිරණ මාවතට හැරෙන හන්දියේ ඇති පොදු ළිඳ දිරාපත්ව කැඩී ඇති බවත්, එම භූමිය සභාව සතු දේපලක් වන බැවින් එම පොදු ළිං ප්‍රතිසංස්කරණය කර ලබා දෙන ලෙස හෝ වෙනත් කිසියම් රාජකාරි කටයුතු කළ හැකි ස්ථානයක් ලෙස සංවර්ධනය කර දෙන ලෙසත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ඒ සඳහා මීළඟ මහා සභා රැස්වීමට විධිමත් සභා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

කපුහෙම්පල සෞඛ්‍ය සායන ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීමට මේ දක්වා නොහැකි වූ බැවින් එය සභාව සතු ගොඩනැගිල්ලක් බවට ලංකා විදුලි බල මණ්ඩලය දැනුවත්කොට මෙම ගැටළුව විසඳා ගැනීමට හැකියාව ඇති බවත්, හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ වඩුඩ් මැතිතුමාගේ නමින් ගිංතොට ප්‍රදේශයේ මාර්ගයක් නම් කිරීමට යෝජනා ඉදිරිපත් වූ නමුත් මාර්ග නම් කිරීමට ඉදිරිපත් වූ අනෙකුත් යෝජනා වලට මෙන්ම දැන්වීම් ඇලවීම පමණක් සිදු වුවද එම කාර්යය සිදු නොවූ බැවින් එම මාර්ග නම් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන මෙන් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

වටරැක, කලුපහන පාරේ බෝක්කුව ඉදිකිරීමේ තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

එම බෝක්කුව ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස්කොට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතින බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල නැවත ඉහළ යා හැකි බැවින් එම කාර්යය සිදු කර දෙන ලෙසත්, ගිංතොට වාළුකාරාම පන්සල අසළ පාරේ ගමනාගමනයට අපහසුතා ඇති බැවින් එම මාර්ගයට යෙදීම සඳහා සිලින්ඩර් දෙකක් මිලදීගෙන ගෙනැවිත් ඇති නමුත් එම සිලින්ඩර් තවම යෙදීමට නොහැකි වූ බවත්, එබැවින් කිංග්ස්කෝට් වෙන්දේසි ඉඩමේ සභාව සතු ඉඩමෙන් හෝ පස් කපා ගෙනැවිත් මෙම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙසත්, ගිංතොට ගිනිකුරුන්ද ප්‍රදේශයේ විශාල කන්දක් පස් ලබා ගැනීම පිණිස කැපීම සිදුකරන බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙසත්, කිංග්ස්කෝට් පාරේ සුළු ප්‍රමාණයක් සංවර්ධනය කිරීම සඳහා ඉතිරිව ඇති බවත්, එම මාර්ග කොටස සංවර්ධනය කර ගැනීමට හා දයානන්ද මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර දෙන ලෙසත්, මේ සඳහා සභා යෝජනා ඉදිරිපත් කොට ඇති බවත් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම අවුරුද්දට අදාළ අයවැය ඉලක්ක මේ වන විට පවතින අර්බුදය හමුවේ මුහුණ දිය යුතු බැවින් ගිවිසුම් අත්සන්කොට ඇති නමුත්, ඉටු නොකරන ලද කර්මාන්ත සඳහා නැවත ඇස්තමේන්තු සකස්කොට වැඩ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන කර්මාන්තද යනුවෙන් ප්‍රගතිය යටතේ සඳහන් කරා නම් එය වටිනා බවත්, රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් සභාවෙන් ජනතාව වෙත ඉටුවිය යුතු වගකීම් නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු බවට මෙම තත්ත්වය නිසා සමස්ත රාජ්‍යයම පීඩාවට පත්වී බිඳවැටීමට ලක්ව ඇති බවත්, මේ නිසා රජය විසින් අත්‍යාවශ්‍ය සේවාවන් හැර අනෙකුත් කටයුතු නතර කරන ලෙස ඉල්ලීම් කොට ඇති බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(පෙ.ව 10.50ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සහ ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ඉදිරියේදී ඉටු කිරීමට බලාපොරොත්තු වන සංවර්ධන කාර්යයන් පිළිබඳ විස්තර තාක්ෂණික සේවා කමිටුවේ අන්තර්ගත බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

2002 වර්ෂයේදී සුරක්ෂා පරිසර නමින් පදනමක් තමා විසින් පවත්වාගෙන ගිය බවත්, ලබුදූව කුරුන්ද කන්ද මුදුනේ ඇති ෆයිනස් වගාව සම්බන්ධයෙන් තමා විසින් දිස්ත්‍රික් ලේකම්තුමා සමග සහ දිස්ත්‍රික් පරිසර කමිටුවේදී සාකච්ඡා කළ බවත්, එම භූමියෙන් ෆයිනස් වගාව ඉවත්කොට කොස් වගා කිරීම සඳහා තමා විසින් යෝජනා කළ බවත්, ජලපෝෂක ශාකයක් ලෙස කොස් සුදුසු බවත්, පහළ ළිංවල ජලය අඩුවීමට හේතුවක් වී ඇත්තේ මෙම ෆයිනස් වගාව බවත්, ෆයිනස් යනු පරිසර හානිකර වගාවක් බවත්, එම අවස්ථාවේදී තමා හට මෙම ෆයිනස් වගාව සහිත ඉඩමේ අයිතිය ඇත්තේ කුමන ආයතනයටද යන්න සොයා ගැනීමට නොහැකිවීම නිසා කොස් පැළ සිටුවීමේ ව්‍යාපෘතිය සිදුකර ගැනීමට නොහැකි වූ බවත්, ප්‍රදේශීය ලේකම් කාර්යාලය හරහා විමසීම් කළ විට එම ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු බවට ප්‍රකාශ කළ බවත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමසීම් කළවිට එම ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු බවට ප්‍රකාශ කළ බවත්, 2002 වර්ෂයේදී එම කොස් වගා ව්‍යාපෘතිය සිදුකර ගැනීමට හැකිවුණේ නම් එය අද වන විට එම ප්‍රදේශයේ ජනතාව වෙත ප්‍රයෝජනවත් වන බවත්, පියදිගම, දඩල්ලට හැරෙන හන්දිය අසළ බිලූ මවුන්ටන් වෙන්දේසි ඉඩම අසළ වීදි ලාම්පු දිවා කාලයේදී පවා දැල්වෙන බවත්, 2022-05-11 වන දින සිට මෙය සිදුවන බවත්, මෙම වීදි පහන් ගාල්ල මහා නගර සභා බල සීමාවේ පවතින බවත්, ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම වීදි පහන සම්බන්ධ ගැටළුව පිළිබඳව තමා විසින් සොයා බැලූ බවත්, එය ගාල්ල මහ නගර සභා සීමාවේදී පවතින බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

බෝපෙ පෝද්දල කොට්ඨාශයට අයත් වීදි ලාම්පුවල සම්බන්ධතාවය ඉවත්කොට ස්විච් එකක් යෙදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම කාර්යය සඳහා තමා පෞද්ගලිකව මැදිහත්වී සොයා බලන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය හට අද දින මහා සභා රැස්වීමට සහභාගිවිය නොහැකි බවට දැනුම් දී ඇති බැවින් නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නරාවල, කාසල්වත්තේ, අනුර රණධීර මහතාගේ නිවස අසළ කණ්ඩිය කැපීම සම්බන්ධව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් කාර්යාලය මගින් ලිපියක් යොමුකොට ඇති බවත්, එම පස් කණ්ඩිය කපා ඉවත් කරන විට පැවති ගල් බැම්මක් කඩා ඉවත් කළා යනුවෙන් එහි සඳහන්ව ඇති නමුත් එවැනි ගල් බැම්මක් එම ස්ථානයේ නොතිබුණ බවත්, ගෙපලක් සකස් කිරීමට ගෙන එන ලද ගල් කිහිපයක් පමණක් එම ස්ථානයේ ගොඩගසා තිබූ බවත්, මෙම ගැටළුව සම්බන්ධව පැමිණෙන ලිපිවල පිටපත් හා ඒවාට පිළිතුරු

යවන ලිපිවල පිටපත් තමා වෙත ලැබීමට සලස්වන ලෙසත්, අවධානම් ලෙස එම පස් කණ්ඩිය කැපීම සිදු නොකළ බවත්, මෙම පස් කණ්ඩිය කැපූ පසු පැවති වර්ෂාවන් වලදී මෙම පස් කණ්ඩිය අවධානමකට ලක් නොවූ බවත්, මෙම ඉඩම සම්බන්ධව අනුර රණධීර මහතා හට හිමිකමක් නොමැති බවත්, ඔහු එම ඉඩමේ අනවසර පදිංචිකරුවෙකු පමණක් බවත්, මේ පිළිබඳව අදාළ ආයතන දැනුවත් කරන ලෙසත්, මෙය ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදි මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීම සඳහා ඉටු කරන ලද කාරණාවක් බවත්, එම ස්ථානයට බැම්මක් යොදනවානම් නිවැරදි මායිමට මාර්ගය මැන බැම්ම ඉදිකළ යුතු බවත්, බැම්ම ඉදිකිරීම සඳහා අඩි දෙකක පමණ ඉඩ තබා ඇති බවත්, නීතිවිරෝධී ආකාරයෙන් එම කණ්ඩිය කපා නොමැති බවත් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පාර නියමිත පළලට මැන අදාළ පැති බැම්ම ඉදිකළ යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මාර්ගයේ නියමිත පළලට මැන ඊට අදාළ පැති බැම්ම ඉදිකළ යුතු බවත්, ගමේ මාර්ගය පළල් කිරීම සඳහා මෙම කාර්යය සිදු කළ යුතු බවත් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම මාර්ගයේ අයිතිය ඇත්තේ ප්‍රාදේශීය සභාවට නම්, පස් කණ්ඩිය කැපීමේ කාර්යය අදාළ පාර්ශවය ලවා සිදුකරගැනීමට හැකියාව තිබූ බවත්, නිවසේ සිට අඩි හයක පමණ දුරක් තබා මෙම පස් කණ්ඩිය කැපීම සිදු කිරීමට හැකියාවක් තිබූ බවත් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම කාර්යය සිදුකලේ මාර්ගය කාපට් කිරීමට අවශ්‍යතාවය හේතුවෙන් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අනුර රණධීර මහතා පදිංචිව සිටින ඉඩමේ අයිතිය ඇත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත බවත්, මෙම සභාවට මාර්ගය පළල් කිරීමට යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ග්‍රාම නිලධාරි මගින් මාර්ගය අත්පත් කරගෙන සිටීම පිළිබඳව දැනුවත් කිරීම සිදුකළ බවත්, අදාළ පස් කණ්ඩිය කපන දිනයේදීද ග්‍රාම නිලධාරි විසින් දැනුවත් කිරීමක් සිදුකළ බවත්, ග්‍රාම නිලධාරි, පොලීසිය, තාක්ෂණ නිලධාරි යන සියළු පාර්ශව ගෙන්වා මෙම කාර්යය සිදුකළ බවත්, තමා විසින් මෙම කාර්යය සිදුකරන ලද්දේ සද්භාවයෙන් මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා බවත්, මෙහිදී කිසිදු පාර්ශවයක් වෙතින් වැරැද්දක් සිදුව නොමැති බවත්, මාර්ගය නිවැරදිව මැනීමකට ලක්කොට, නිවැරදි මායිමේ පැති බැම්ම ඉදිකළ යුතු බවත්, තමා පදිංචි නිවස පිහිටි භූමියේද කණ්ඩිය කැපූ බවත්, තම නිවසට පිවිසීම සඳහාද මේ වන විට පිවිසුම් මාර්ගයක් නිසියාකාරව නොමැති බවත්, මෙම ගැටළුව සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය දිනක තම ප්‍රදේශයේ විහාරස්ථානයේ උපසම්පදා පුණ්‍ය කර්මයක් පැවති බවත්, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් විහාරස්ථානයේ දායක සභාව නියෝජනය කරන කෙනෙකු ලෙස ඒ සම්බන්ධව ස්තුතිය පුදකරන බවත්, මේ සඳහා ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාද මැදිහත් වූ බවත්, එබැවින් මේ සම්බන්ධව සභාවේ සේවක මහත්වරුහටත්, ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාටත් ස්තුතිවන්ත වන බවට ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු :-</u>**

I. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
II. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
III. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
IV. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2022-07-20 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු පෙ.ව 11.15 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.